Cestim
centro studi immigrazione

# 2020 වෙස්ටිම් මධ්‍යස්ථාන මගින් පවත්වන ගිම්හාන සමයේ ONLINE ඉතාලි භාෂා පාඨමාලාව

<u>පැය 32ක පාඨමාලාව</u>

ඉතාලි භාෂාව ඉගෙන ගත යුතු උසස් ශ්‍රේණි වල සිසුන් සඳහා
මෙම පාඨමාලාව සූදානම් කර ඇත.

| |
|---|
| ජූලි 6 සඳුදා සිට ජූලි 31 සිකුරාදා දක්වා පාඨමාලාව පවත්වනු ඇත. |
| සතියේ දින හතරක් පැවැත්වේ: සඳුදා ,අඟහරුවාදා ,බ්‍රහස්පතින්දා සහ සිකුරාදා (පැය 32ක පාඨමාලාව) |
| උදේ 9.30 සිට 11:30 දක්වා |
| වීඩියෝ පාඩම් ආකාරයෙන් (MEET යෙදුම මගින් )පැවැත්වේ. |
| සෑම පවුලකින්ම € 20 ක දායකත්වයක් ඉල්ලා සිටී. |

වෙස්ටිම් මධ්‍යස්ථානය සහ පාසල විසින් පැය 32 කින් යුත් ඉතාලි භාෂා පාඨමාලාව වීඩියෝ පාඩම් ක්‍රමයක් සමඟ ඉදිරිපත් කිරීමට තීරනය කර ඇත. මෙම පාඨමාලාව ගිම්හාන නිවාඩු සමය තුළ ඉතාලි භාෂාව ප්‍රායෝගිකව ඉගෙන ගැනීමට වටිනා අවස්ථාවක් වේ. වෙස්ටිම් මධ්‍යස්ථානයේ ගුරුවරුන් ඉතාලි භාෂාව ඉගැන්වීම සඳහා පළපුරුදු තරුණ උපාධිධාරීන් ය. මෙම පාඨමාලාව සඳහා සහභාගි වන සිසුන් සඳහා භාෂා අභ්‍යාස මගින් වාචිකව හා ලිඛිතව ඉතාලි භාෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමට ඉඩ සලසා දී ඇත. භාෂා මට්ටම අනුව සිසුන් 8-10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් වලට බෙදා ඇත.

**<u>වීඩියෝ පාඩම් වලට සහභාගී වීමට අවශ්‍ය වන්නේ කුමක්ද?</u>**

1) වීඩියෝ කැමරාවක් සහ මයික්‍රොෆෝනයක් සහිත පරිගණකයක් හෝ ටැබ්ලටයක් තිබිය යුතුයි.
2) අන්තර්ජාල සම්බන්ධතාවයක් තිබිය යුතුයි.

**<u>ලියාපදිංචි වන්නේ කෙසේද?</u>**

1) පාඨමාලාවට ඇතුළත් වීමේ පෙර ආකෘති පත්‍රය ජූනි 7 වන දිනට පෙර දෙමාපියන් විසින් සම්පූර්ණ කළ යුතුය.
2) වෙස්ටිම් මධ්‍යස්ථානය තම කැමැත්ත ප්‍රකාශ කළ සියලුම පවුල්වලට ජූනි 15 වන දිනයට පෙර ප්‍රතිචාරයක් ලබා දීමට තීරනය කර ඇත.
3) වෙස්ටිම් මධ්‍යස්ථානයේ ගුරුවරු විසින් භාෂා මට්ටම තක්සේරු කිරීම සඳහා ප්‍රවේශ විභාගය සඳහා සම්බන්ධ විය යුතු link මාර්ගය දැනුවත් කිරීම සඳහා කෙටි පණිවිඩයක්(sms) එවනු ඇත.

**<u>ස්වේච්ඡා දායකත්වය</u>**

පාඨමාලාව සඳහා වන පිරිවැයෙන් 98% ක් ගෙවනු ලබන්නේ පුද්ගලික පුණ්‍යායතනයක් වන SAN ZENO පදනම විසිනි. ව්‍යාපෘතියේ පිරිවැයට එක පවුලකින් € 20 ක් පමණ සුළු දායකත්වයක් ඉල්ලා සිටී. එම මුදල ගෙවිය යුත්තේ ලියාපදිංචිය තහවුරු කිරීමෙන් පසුව පමණි.

Con il sostegno di
fondazionesanzeno